සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II | පැය තුනයි |
| முயற்சியாண்மைக் கற்கை | I, II | மூன்று மணித்தியாலம் |
| Entrepreneurship Studies | I, II | Three hours |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** ව්‍යවසායකත්වය තුළ දැකිය හැකි මූලික ලක්ෂණයක් වනුයේ,
(1) පවත්නා අදහස් සහ සංකල්ප එලෙසම ක්‍රියාත්මක වීමට සැලසීම වේ.
(2) පවතින දේ පිළිබඳ විමසිලිමත් වෙමින් වෙනසක් කිරීමට උත්සාහ දැරීම වේ.
(3) අවදානම් මග හරිමින් ව්‍යාපාර කටයුතුවල නිරතවීම වේ.
(4) ලාභය උපරිම කිරීමට පමණක් ක්‍රියා කිරීම වේ.

**2.** ව්‍යවසායකයා නිරතුරුවම විශ්වාස කරන්නේ,
(1) තමා පිළිබඳව ය. (2) අන් අය පිළිබඳව ය.
(3) වාසනාව පිළිබඳව ය. (4) දෛවය පිළිබඳව ය.

**3.** අන් අයගේ අදහස්වලට ගරු කරන නමුත් ඒ මත නොයැපීම හා තමන් යා යුතු ගමන් මග තමන්ම තීරණය කිරීම ව්‍යවසායකත්වයේලා සැලකිය හැක්කේ,
(1) ස්වාධීනත්වය ලෙස ය. (2) වගකීම ලෙස ය.
(3) අභියෝග ලෙස ය. (4) සුභවාදී වීම ලෙස ය.

**4.** ව්‍යාපාර අදහසක් ක්‍රියාත්මක කිරීමේ දී 'අවදානම් ගැනීම' යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?
(1) එම අදහස සාර්ථක වීම හෝ අසාර්ථක වීම
(2) එම අදහස අසාර්ථක වීමට ඇති ඉඩකඩ වැඩි බව
(3) එම අදහස ක්‍රියාවට නැංවීමට අපහසු බව
(4) එම අදහසේ ප්‍රතිඵල නිශ්චිත වන බව

**5.** ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට හිමි වන ප්‍රතිලාභයක් වනුයේ,
(1) නව භාණ්ඩ හා සේවා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම වේ.
(2) අපනයන මගින් විදේශ විනිමය ඉපයීමේ හැකියාව වේ.
(3) ආර්ථික සංවර්ධනයට දායක වීම වේ.
(4) නිදහස හා ඉතා ඉහළ තෘප්තිය වේ.

**6.** ව්‍යවසායකයකුගේ භූමිකා දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) අයිතිකරු, කළමනාකරු, නායකයා (2) කළමනාකරු, නව්‍යතා සම්පාදකයා, නායකයා
(3) නායකයා, සැපයුම්කරු, කළමනාකරු (4) අයිතිකරු, කළමනාකරු, නිෂ්පාදකයා

**7.** පරිසරයේ වෙනස්වීම්වලට උචිත පරිදි අනුගත වීමට ඇති හැකියාව,
(1) නම්‍යශීලීත්වය වේ. (2) අධිෂ්ඨානය වේ. (3) ස්වාධීනත්වය වේ. (4) කැපවීම වේ.

**8.** පරිසරයේ ඇති අවස්ථා හඳුනාගෙන, අවදානම් දරමින්, නවෝත්පාදන සිදු කරන්නා,
(1) ව්‍යාපාරිකයා වේ. (2) සැපයුම්කරුවා වේ. (3) ව්‍යවසායකයා වේ. (4) නිෂ්පාදකයා වේ.

[ දෙවැනි පිටුව බලන්න.

**9.** අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාව දැක්වෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ. (2) අවදානම පහළ නම් ප්‍රතිලාභය ඉහළ වේ.
(3) අවදානම ඉහළ නම් ප්‍රතිලාභය පහළ වේ. (4) අවදානමේ ස්වභාවය කුමක් වුවත් ප්‍රතිලාභය ඉහළ වේ.

**10.** පුද්ගලයකුට තම ජීවිතය පවත්වාගෙන යාමට අනිවාර්යයෙන් ම සපුරාගත යුතු මූලික දෑ,
(1) අවශ්‍යතා වේ. (2) වුවමනා වේ. (3) භාණ්ඩ වේ. (4) සේවා වේ.

**11.** මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලන භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,
(1) අස්පෘශ්‍ය බවයි.
(2) සමජාතීය බව ආරක්ෂා කළ හැකි වීමයි.
(3) ගබඩා කළ නොහැකි වීමයි.
(4) සපයන්නාගෙන් වෙන් කළ නොහැකි බවයි.

**12.** ව්‍යවසායකයා පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යවසායකයා ගතානුගතික හා සාම්ප්‍රදායික වේ.
(2) ව්‍යවසායකයා කෙටි කාලීන අරමුණු ඇති කර ගනියි.
(3) ව්‍යවසායකයා තරගයට මුහුණදීමට කැමැත්තක් නොදක්වයි.
(4) ව්‍යවසායකයා අවදානම් හොඳින් තක්සේරු කර දැරිය හැකි අවදානම් පමණක් භාර ගනියි.

**13.** සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මකව විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයා,
(1) අභ්‍යන්තරික ව්‍යවසායකයා වේ. (2) සමාජයීය ව්‍යවසායකයා වේ.
(3) ව්‍යාපාර ව්‍යවසායකයා වේ. (4) නිර්මාණශීලී ව්‍යවසායකයා වේ.

**14.** පවතින භාණ්ඩයක, සේවාවක හෝ ක්‍රියාවලියක නව භාවිතයක් ඇති කිරීම නවෝත්පාදන සිදු වන ආකාරයකි. මෙය හඳුන්වනු ලබන්නේ,
(1) සංකලනයක් ලෙස ය. (2) අනුකරණයක් ලෙස ය.
(3) නව සොයාගැනීමක් ලෙස ය. (4) දිගුවක් ලෙස ය.

**15.** අලෙවි සැලැස්මක් පිළියෙල කිරීමේ දී සලකා බලනු ලබන කරුණු ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ඉලක්ක වෙළෙඳපොළ, අලෙවිකරණ උපායමාර්ග, අලෙවිකරණ ප්‍රදේශය
(2) ඒකක පිරිවැය, අලෙවිකරණ උපායමාර්ග, ඉලක්ක වෙළෙඳපොළ
(3) සේවක වැටුප්, ඒකක පිරිවැය, අලෙවිකරණ ප්‍රදේශය
(4) තනතුරු සහ වගකීම්, සේවක වැටුප්, ඒකක පිරිවැය

**16.** කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්ෂණයක් වනුයේ,
(1) පොදු හිමිකාරිත්වයක් පැවතීම ය.
(2) අනෙකුත් ව්‍යාපාර සමග සසඳන විට කුඩා සේවක සංඛ්‍යාවක් සිටීම ය.
(3) ආයෝජනය ඉහළ වීම ය.
(4) ව්‍යාපාර කටයුතු විශාල ප්‍රදේශයක ව්‍යාප්තව පැවතීම ය.

**17.** පහත වාක්‍ය අතුරෙන් වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න.
(1) බොහෝ නවෝත්පාදන බිහි වී ඇත්තේ මහා පරිමාණ ව්‍යාපාර තුළිනි.
(2) දැනටමත් පාරිභෝගික අවශ්‍යතා ඉටුකර ඇති කොටස 'වෙළෙඳපොළ හිදැස' නම් වේ.
(3) බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාරයක් වේ.
(4) මහා පරිමාණ ව්‍යාපාර බොහොමයක ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වී ඇත.

**18.** ක්‍රියාවලි අවශ්‍යතාව පදනම් කොට ගෙන ඇති වන නවෝත්පාදනයක් වනුයේ,
(1) දර සැපයීම අඩු වීම නිසා විදුලි උපකරණ භාවිතයෙන් නිෂ්පාදන කටයුතු කිරීමයි.
(2) දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමයි.
(3) නව පරිගණක දෘඩාංග හඳුන්වා දීමයි.
(4) ශාකසාර භාවිත කර සබන් නිෂ්පාදනය කිරීමයි.

**19.** සේවකයන් පෙලඹවීම හා අවශ්‍ය මග පෙන්වීම ව්‍යවසායකයාගේ,
(1) ව්‍යාපාරිකයා ලෙස වූ භූමිකාවයි. (2) කළමනාකරු ලෙස වූ භූමිකාවයි.
(3) අයිතිකරු ලෙස වූ භූමිකාවයි. (4) නායකයා ලෙස වූ භූමිකාවයි.

[ තුන්වැනි පිටුව බලන්න.

**20.** පහත සඳහන් හැකියාවන් අතුරෙන් ව්‍යවසායකයකුගේ මානව කුසලතා ගණයට අයත් වන්නේ කුමක් ද?
(1) විධිමත් පටිපාටියක් අනුගමනය කොට හොඳ සේවකයකු බඳවා ගැනීමට ඇති හැකියාව
(2) සේවකයන්ට වැඩ පැවරීමට සහ පෙළඹවීමට ඇති හැකියාව
(3) නව වෙළෙඳපොළ සොයා ගැනීමට ඇති හැකියාව
(4) කණ්ඩායමක් ලෙස වැඩ කිරීමට ඇති හැකියාව

**21.** ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) අයිතිකරුවන්, සේවකයන්, තරගකරුවන්
(2) තරගකරුවන්, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්
(3) අයිතිකරුවන්, සේවකයන්, කළමනාකරුවන්
(4) සේවකයන්, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්

**22.** ව්‍යාපාරයක ආචාර ධර්ම තීරණය කිරීමෙහිලා බලපෑම් කරන ප්‍රධාන පාර්ශ්ව තුන වනුයේ,
(1) ප්‍රවර්ථකයන්, ආයතනයේ සාමාජිකයන් හා බාහිර සමාජය වේ.
(2) ප්‍රවර්ථකයන්, සමාජ සංවිධාන හා සේවකයන් වේ.
(3) සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන් හා හිමිකරුවන් වේ.
(4) ප්‍රවර්ථකයන්, ගනුදෙනුකරුවන් හා ආයෝජකයන් වේ.

**23.** ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රාථමික අංශයට අයත් ව්‍යාපාරයක් වනුයේ,
(1) සපත්තු නිෂ්පාදනය කිරීමයි.
(2) ගොඩනැගිලි ඉදිකිරීමයි.
(3) රක්ෂණ සේවා සැපයීමයි.
(4) මැණික් කර්මාන්තයයි.

**24.** දියවැඩියා රෝගීන් සඳහා විශේෂිත පාවහන් හඳුන්වාදීම සැලකිය හැක්කේ,
(1) පවත්නා භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(2) පවත්නා භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(3) නව භාණ්ඩයක් පවත්නා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.
(4) නව භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමක් ලෙස ය.

**25.** ව්‍යවසායකයකුගේ නව අදහසක්, අලෙවි කළ හැකි භාණ්ඩයක් හෝ සේවාවක් බවට පරිවර්තනය වීම හැඳින්විය හැක්කේ,
(1) නවෝත්පාදනය ලෙස ය.
(2) නිර්මාණශීලීත්වය ලෙස ය.
(3) දැක්ම ලෙස ය.
(4) අවදානම් භාර ගැනීම ලෙස ය.

**26.** ආර්ථික පිරිමැසුම් සහිත කිරිපිටි පැකට්ටුවක් (Budget pack) ඉදිරිපත් කරමින් වෙළෙඳපොළට පිවිසීම හැඳින්විය හැක්කේ,
(1) නිෂ්පාදිත ප්‍රභේදනය ලෙස ය.
(2) වෙළෙඳපොළ හිඩැස පිරවීම ලෙස ය.
(3) නවෝත්පාදනය ලෙස ය.
(4) සුවිශේෂී නව භාණ්ඩයක් ලෙස ය.

**27.** විවිධ කුසලතා සහිත කළමනාකරුවන් බඳවා ගැනීම සංවිධානයකට,
(1) දුර්වලතාවකි.
(2) අවස්ථාවකි.
(3) ශක්තියකි.
(4) තර්ජනයකි.

**28.** ව්‍යාපාරයක අරමුදල් සම්පාදනය හා යෙදවීම් පිළිබඳව තොරතුරු ඇතුළත් වන සැලැස්ම,
(1) පරිපාලන සැලැස්ම වේ.
(2) මූල්‍ය සැලැස්ම වේ.
(3) නිෂ්පාදන සැලැස්ම වේ.
(4) අලෙවි සැලැස්ම වේ.

**29.** පෞද්ගලික සහ රාජ්‍ය ලෙස ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි පදනම,
(1) ලාභය වේ.
(2) අරමුණ වේ.
(3) හිමිකාරිත්වය වේ.
(4) සේවක සංඛ්‍යාව වේ.

**30.** ලාභ හෝ පාඩු තනිව භුක්ති විඳීම දැකිය හැක්කේ,
(1) හවුල් ව්‍යාපාරවල ය.
(2) සංස්ථාපිත සමාගම්වල ය.
(3) කේවල ස්වාමි ව්‍යාපාරවල ය.
(4) දෙපාර්තමේන්තුවල ය.

**31.** ව්‍යාපාරයක සීමිත සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම, එහි
(1) ආර්ථික වගකීමකි.
(2) නීතිමය වගකීමකි.
(3) පරාර්ථකාමී වගකීමකි.
(4) සදාචාරාත්මක වගකීමකි.

32. ව්‍යාපාරයක බාහිර පරිසරයට අයත් සාධක වනුයේ,
(1) ගනුදෙනුකරුවන්, මිල මට්ටම හා සේවා නියුක්තිය වේ.
(2) සේවකයන්, වැටුප් මට්ටම හා පොලී අනුපාතිකය වේ.
(3) සම්පත්, මිල මට්ටම හා සේවා නියුක්තිය වේ.
(4) තරගකරුවන්, කළමනාකරුවන් හා සේවකයන් වේ.

33. ව්‍යාපාරයක් කෙරෙහි උනන්දු වන පාර්ශ්වයන්ගේ විවිධ වූ අපේක්ෂා පවතී. ඒ අතුරෙන් එක් පාරිභෝගික අපේක්ෂාවක් වනුයේ,
(1) නීතිමය ප්‍රශ්න අවම කර ගැනීම වේ.
(2) බදු මුදල් නිසි පරිදි අයකර ගැනීම වේ.
(3) සමාජ හා සංස්කෘතික සංවර්ධනය වේ.
(4) සාධාරණ මිලට ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීම වේ.

34. ජාතික ප්‍රමිති සකස් කිරීම, තත්ත්ව පද්ධති සහතික කිරීම වැනි මූල්‍ය නොවන දිරිගැන්වීම් ලබා දෙනුයේ,
(1) කාර්මික තාක්ෂණ ආයතනයයි.
(2) කාර්මික සංවර්ධන මණ්ඩලයයි.
(3) අපනයන සංවර්ධන මණ්ඩලයයි.
(4) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයයි.

35. යම් කාලච්ඡේදයක් අවසානයේ ඇති මුදල් ශේෂය ගණනය කරනුයේ,
(1) මුදල් ගලා යෑම් වලින් මුදල් ගලා ඒම් අඩු කිරීමෙනි.
(2) මුදල් ගලා ඒම් වලින් මුදල් ගලා යෑම් අඩු කිරීමෙනි.
(3) මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යෑම් එකතු කිරීමෙනි.
(4) සියළුම මුදල් ගලා ඒම් එකතු කිරීමෙනි.

- පහත සිද්ධිය කියවා අංක **36** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුගත් සහ සමීර හොඳ මිතුරෝ ය. දෙදෙනා අතර වූ සුහද කතාබහක දී සුගත් සමීරට පැවසුවේ කෙදිනක හෝ තමා දේශීය සම්පත් භාවිත කර ව්‍යාපාරයක් අරඹා ව්‍යවසායකයකු වන බව ය. තවදුරටත් ඔහු පැහැදිලි කලේ තමාට ද, සමාජයට ද, රටට ද වැඩදායී පුද්ගලයකු වන බව ය.

එහෙත් සමීරගේ අදහස වූයේ ඕනෑම පුද්ගලයකුට ව්‍යවසායකයකු විය හැකි බවත්, ඕනෑම කෙනෙකු වැඩිහිටියකු වීමේ දී ව්‍යවසායකත්ව කුසලතා නිරායාසයෙන්ම වර්ධනය වන බවත් ය. තව ද සමීර පැවසුවේ සුගත්ගේ සාමාන්‍ය චර්යා ස්වභාවය වන සමාජානුගත ආකල්ප හා විශ්වාස දැඩි ලෙස පිළිගැනීම, විවේචන හා අසාර්ථකවීම් සඳහා ඇති දැඩි බිය හා අකමැත්ත සුගත්ගේ සාර්ථකත්වය සීමා කරන බවත් ය.

36. දේශීය සම්පත් උපයෝජනය කර ගනිමින් ව්‍යාපාර ආරම්භ කිරීම ව්‍යවසායකත්වයේ,
(1) තමාට සීමා වූ ප්‍රතිලාභයකි.
(2) ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිලාභයකි.
(3) ජාතික මට්ටමේ ප්‍රතිලාභයකි.
(4) සංවර්ධන මට්ටමේ ප්‍රතිලාභයකි.

37. විවේචන හා අසාර්ථකවීම් සඳහා සුගත් තුළ ඇති දැඩි බිය හා අකමැත්ත සීමාකාරී සාධකයක් ලෙස බලපානුයේ,
(1) පරිසර සංවේදීභාවයට ය.
(2) අවදානම් බාර ගැනීමට ය.
(3) නිර්මාණශීලිත්වයට ය.
(4) දැක්මට ය.

38. තමාට ද, සමාජයට ද, රටට ද වැඩදායී පුද්ගලයකු වීමට සුගත් තුළ පවතින සිහිනය හැඳින්විය හැක්කේ,
(1) දැක්ම ලෙස ය.
(2) නිර්මාණශීලිත්වය ලෙස ය.
(3) කැපවීම ලෙස ය.
(4) ආත්ම විශ්වාසය ලෙස ය.

39. "පුද්ගලයින් වැඩිහිටියන් වීමේ දී ව්‍යවසායකත්ව කුසලතා නිරායාසයෙන්ම වර්ධනය වේ." මෙම ප්‍රකාශය,
(1) සත්‍ය වේ.
(2) අසත්‍ය වේ.
(3) අර්ධ සත්‍ය වේ.
(4) පූර්ණ සත්‍ය වේ.

40. කෙදිනක හෝ ව්‍යවසායකයකු බවට පත් වීමට සුගත් තුළ ඇති දැඩි අධිෂ්ඨානශීලී බව,
(1) තර්ජනයකි. (2) අවස්ථාවකි. (3) දුර්වලතාවකි. (4) ශක්තියකි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II
முயற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉතා අධිෂ්ඨානශීලී තරුණයකු වූ මලිත පාසල් අධ්‍යාපනය අවසන් කළ පසු තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දැඩි කැමැත්තෙන් පසු විය. පාසල් අධ්‍යාපනය තුළින් ඔහු ලත් දැනුම මත පරිසරය විශ්ලේෂණය කිරීම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් බව මලිත දන්නේ ය. ඒ අනුව ඔහු රටේ ආර්ථිකය සහ ජනගහනය පිළිබඳ ව තොරතුරු එකතු කළේ ය. එහි දී වැඩිහිටි ජනගහනය ඉහළ යාම, කාන්තාවන් වැඩිදෙනෙකු රැකියා සඳහා යොමු වීම, දරුවන් රැකබලා ගැනීමේ ගැටලු, නිවසේ වැඩ කටයුතු ක්‍රමවත්ව කරගෙන යාමේ ගැටලු, තරුණ පාර්ශ්වයේ ආකල්පමය වෙනස්වීම්, බැංකු ණය පොලී අනුපාත ඉහළ මට්ටමක පැවතීම සහ ජීවන වියදම සීඝ්‍රයෙන් ඉහළ යාම යනා දී ලෙස ජනගහනය සහ ආර්ථිකය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු කිහිපයක් ම මලිතට හඳුනාගත හැකි විය.

(i) 'ව්‍යාපාර පරිසරය' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?
(ii) මලිත විසින් අධ්‍යයනය කර ඇති බාහිර ව්‍යාපාර පරිසර නම් කරන්න.
(iii) බාහිර පරිසරය විශ්ලේෂණය කිරීම තුළින් මලිතට හඳුනාගත හැකි වූ අවස්ථා **දෙකක්** සහ තර්ජන **දෙකක්** දක්වන්න.
(iv) මලිත හඳුනාගත් අවස්ථා ප්‍රයෝජනයට ගෙන ආරම්භ කළ හැකි ව්‍යාපාර **හතරක්** දක්වන්න.
(v) සාර්ථක ව්‍යවසායකයකු වීම සඳහා මලිත විසින් වර්ධනය කර ගත යුතු කුසලතා **දෙකක්** සඳහන් කරන්න.

- ඉහත හඳුනාගත් අවස්ථා ඇසුරෙන් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මලිත තීරණය කළ අතර, එය නිසි සැලැස්මකට අනුව පවත්වා ගෙන යාමට ද අදහස් කරයි. ඒ සඳහා පහත වියදම් දැරීමට සිදු වන බවට ඔහු ඇස්තමේන්තු කර ඇත.

| | රු. |
|---|---|
| ගොඩනැගිල්ල | 1 000 000 |
| කාර්යාලීය ලී බඩු | 460 000 |
| ලියාපදිංචි ගාස්තු | 2 000 |
| ව්‍යාපාර සැලසුම සකස් කිරීමේ වියදම් | 25 000 |
| සමාරම්භක උත්සව වියදම් | 18 000 |
| වෙළෙඳපොළ සමීක්ෂණ වියදම් | 15 000 |
| දෛනික සේවක වැටුප් | 20 000 |
| දෛනික ගමනාගමන වියදම් | 1 000 |
| අනෙකුත් දෛනික වියදම් | 19 000 |

ඉහත තොරතුරු ඇසුරෙන්,

(vi) මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම ගණනය කරන්න.
(vii) මුළු ආරම්භ කිරීමට පෙර වියදම් ගණනය කරන්න.
(viii) කාරක ප්‍රාග්ධනය ගණනය කරන්න.
(ix) මුළු ආයෝජනය ඇස්තමේන්තුගත කරන්න.
(x) මලිතගේ ව්‍යාපාරයේ මුදල් ගලා යැම් **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

2. (i) ව්‍යවසායකයකු සහ ව්‍යාපාරිකයකු අතර දැකිය හැකි සමානතා **දෙකක්** සහ වෙනස්කම් **දෙකක්** දක්වන්න.
(ii) ව්‍යවසායකයකුට සමාජයීය සුභසාධනය සඳහා දායක විය හැකි ක්‍රම **හතරක්** දක්වන්න.
(iii) වර්තමාන සමාජය තුළ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග **දෙකක්** දක්වන්න.
(iv) කාන්තාවන්, ව්‍යවසායකයන් වීම සඳහා පොළඹවන ශක්තීන් **හතරක්** දක්වන්න.
(v) ව්‍යාපාර කටයුතු කෙරෙහි උනන්දු වීමෙන් සේවකයන් හා රජය ලඟාකර ගැනීමට අදහස් කරන අපේක්ෂා **දෙක** බැගින් වෙන වෙන ම දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

[ හයවැනි පිටුව බලන්න.

3. (i) ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ **හතරක්** දක්වන්න.
(ii) ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කිරීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.
(iii) ව්‍යාපාර සංවිධානයක් සම්බන්ධව සලකා බලන විට 'ශක්තීන්' ලෙස ඔබ අදහස් කරන්නේ කුමක් ද? කුඩා ව්‍යාපාරයක දැකිය හැකි ශක්තීන් **දෙකක්** දක්වන්න.
(iv) ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න.
(v) පුද්ගලයකු තුළ ඇති අවශ්‍යතා **දෙකක්** දක්වා, ඊට අදාළ වුවමනා **දෙක** බැගින් දක්වන්න.
(ලකුණු 02 × 05 = 10 යි)

4. (i) නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.
(ii) ඔබ ප්‍රදේශයේ ඇති ගැටලු **දෙකක්** දක්වා, ඒ සඳහා ඉදිරිපත් කළ හැකි නිර්මාණශීලී විසඳුම බැගින් දක්වන්න.
(iii) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය වෙනස්වීම තුළින් පැන නැගී ඇති ව්‍යාපාරික අවස්ථා **දෙකක්** දක්වන්න.
(iv) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.
(v) ව්‍යාපාරයක නීතිමය වගකීම සඳහා උදාහරණ **දෙකක්** දෙන්න.
(ලකුණු 02 × 05 = 10 යි)

5. (i) ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ සිතුවිල්ල ක්‍රියාවට නැංවීමට පෙර ව්‍යවසායකයකු විසින් සැලකිය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර පරිසරය තුළ පවතින තරගකාරීත්වය දැක්වීම සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න.
(iii) ව්‍යාපාරය පිහිටුවන ස්ථානය තීරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.
(iv) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ **හතරක්** දක්වන්න.
(v) ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීම සඳහා හිතකර වන සමාජයීය සහ ආර්ථික සාධක **දෙකක්** දක්වන්න.
(ලකුණු 02 × 05 = 10 යි)

6. (i) 'ව්‍යාපාර සැලැස්ම' යන්න ඔබේ වචනයෙන් පහදන්න.
(ii) ව්‍යාපාර සැලැස්මක මූලිකාංග **හතරක්** දක්වන්න.
(iii) ව්‍යාපාරයකට සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි? හේතු **හතරක්** සඳහන් කරන්න.
(iv) වෙළෙඳපොළ විශ්ලේෂණයකින් හඳුනා ගත හැකි කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(v) පහත දැක්වෙන භාණ්ඩ සඳහා ඉලක්කගත පාරිභෝගික කොටස දක්වන්න.
(අ) විසිතුරු අත් බෑග්
(ආ) සෙල්ලම් භාණ්ඩ
(ඉ) බණ පොත්
(ඊ) සීනි රහිත අයිස්ක්‍රීම්
(ලකුණු 02 × 05 = 10 යි)

7. ප්‍රකාශ් තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාමට අපේක්ෂා කරන අතර, ඔහුගේ ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් 2017 වර්ෂය සඳහා උපුටාගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අයිතිකරු යොදවන මුදල | 800 000 |
| බැංකු ණය | 1 000 000 |
| අපේක්ෂිත විකුණුම් (මුදලට) | 700 000 |
| අපේක්ෂිත විකුණුම් (ණයට) | 400 000 |
| ණයගැති ලැබීම් | 300 000 |
| ණය වාරික ගෙවීම් | 100 000 |
| විදුලි බිල්පත් ගෙවීම | 30 000 |
| විකිණීම සඳහා භාණ්ඩ මිලට ගැනීම | 500 000 |
| දුරකථන ගාස්තු ගෙවීම | 15 000 |
| උපකරණ මිලට ගැනීම් | 200 000 |
| සේවක වැටුප් ගෙවීම් | 300 000 |

**අවශ්‍ය වන්නේ :**

(i) 2017 වර්ෂය සඳහා ප්‍රකාශ්ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ලකුණු 06 යි)
(ii) 2017 වසර අවසානයේ ප්‍රකාශ්ගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය (ලකුණු 02 යි)
(iii) ප්‍රකාශ් ආරම්භ කිරීමට අපේක්ෂා කරන තනි පුද්ගල ව්‍යාපාරයක මූලික ලක්ෂණ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)
(මුළු ලකුණු 10 යි)

***

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්වා ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

www.store.pastpapers.wiki

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers

